# සත්ත්ව ආචාර ධර්ම පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

**වී.ඊ.කේ. මධුෂානි**[1]

හැඳින්වීම

අප ජීවත් වන ලෝකය ප්‍රධාන වශයෙන් කොටස් දෙකක් යටතේ වර්ග කළ හැකි වේ. එනම් ජීව පරිසරය හා අජීව පරිසරය වශයෙනි. මිනිසා ඇතුළු ලෝකයේ ගොඩබිම හා ජලය ජීවත්වන සෑම සතෙක්ම ජීව පරිසරයට අයත් වේ. ඒ අතර මිනිසා වනාහී උසස් මනසකින් හෙබි සත්වයෙක් ලෙස හඳුන්වා දිය හැකි වේ. මිනිසා තමන් සතු දැනුම් පදනම් කරගෙන අනෙක් සතුන්ට අයිති ඔවුන්ගේ ලෝකය ආක්‍රමණය කරමින් සිටිනු ලබයි. එනම් සතුන් විනාශ කරමින් තම කටයුතු මානුෂියව මෙන් ම අමානුෂීයව කර ගැනීමට මිනිසා පෙළඹී ඇත. මෙලොව උපත ලබන සෑම මනුෂ්‍යයෙකුටම ජීවත්වීමේ හිමිකම පවතී. ඒවා මානව හිමිකම් ලෙස අර්ථ දක්වයි. එලෙස මහ පොළොවේ උපත ලබන සියලු තිරිසන් සතුන්ට ද ජීවත් වීමේ අයිතිය ඇති අතර ඒවා සත්ව හිමිකම් ලෙස හඳුන්වා දිය හැකි වේ. මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව බවට පත්වන්නේ සත්ත්ව ආචාර ධර්ම පද්ධතියක් රටකට අවශ්‍යය ද? යන්නයි ඇත්ත වශයෙන්ම ගත් කල මනුෂ්‍ය අයිතිවාසිකම් තරමටම සත්ව අයිතිවාසිකම් ද ආරක්ෂා වීම වැදගත් වේ. මන්ද දියුණු රටවල මානව අයිතිවාසිකම් තරමට ම සත්ව අයිතිවාසිකම් ආරක්ෂා වනු ලබයි. රිචඩ් ඩී රයිඩර් නැමති විචාරකයාට අනුව සත්ව අයිතිවාසිකම් යනු සත්ත්ව විශේෂයන්ට ඔවුන්ගේ අවශ්‍යතාවන් හා උවමනාවන්ට ගරු කරමින් සැලකීමත් හැඟීම් දැනීම් නොමැති වස්තු ලෙස නොසැලකීමත් යන්නයි. මෙම අධ්‍යනයේ මූලික පරමාර්ථය වනුයේ මෙලොව ජීවත්වන සියලු සතුන්ට ද ආචාර ධර්ම පද්ධතියක් පවතින බව දැනුවත් කිරීම, මීට අමතර ව සතුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන අවස්ථා පෙන්වා දීම, සත්ත්ව අයිතිවාසිකම් සුරැකීමට ගත හැකි ක්‍රියා මාර්ග ප්‍රවර්ධනය කිරීම, සතුන් හිංසනයට ලක්වන අවස්ථාවන් අනාවරණය කිරීම, සත්ත්ව හිංසනය සම්බන්ධයෙන් පවතින නෛතික පැතිකඩ හඳුන්වා දීම ආදිය මෙම අධ්‍යයනයේ සෙසු අරමුණු බවට පත් වේ.

මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී භාවිත කරන ලද සාහිත්‍ය විමර්ශනයන් පහත ලෙස දැක්විය හැකි වේ. ශ්‍රී ලංකාව තුළ පුළුල් ලෙස සත්ත්ව ආචාර ධර්ම පිළිබඳ අවධානය යොමු කරන ප්‍රවණතාව ඉතාම අවම වී ඇත. එසේ ම සත්ත්ව ආචාර ධර්ම පිළිබඳ ව වෙන් වෙන් වශයෙන් රචනා කරන ලද ග්‍රන්ථ නොමැති තරම්ය. සංයුක්ත නිකාය (2005) මෙත්තානිසංස සූත්‍රය ගත්විට එහි දී බුදුදහම තුළ සියලු සත්වයන්ට මෛත්‍රී කළ යුතු බව දක්වනු ලබයි. මේකී ග්‍රන්ථ මගින් බුදුදහම තුළ සතුන් කෙරෙහි අවධානය යොමු කළ යුතු බව දක්වනු ලබයි. එනම් මිනිසාට මෙන් ම සතුන්ට ද මෛත්‍රී කළ යුතු බව බුදුදහමේ දක්වනු ලබයි. ගලඋඩ රතනාලෝක හිමියන් විසින්

1. පේරාදෙණිය විශ්වවිද්‍යාලය, 20400, ශ්‍රී ලංකාව. a19426@arts.pdn.ac.lk

රචිත දාර්ශනික සංකතන කෘතිය තුළ අන්තර්ගත සත්ත්ව ආචාර ධර්ම පිළිබඳ ලිපිය මගින් සත්ත්ව ආචාර ධර්ම පිළිබඳ ව පුළුල් පරාසයක් ආවරණය කරනු ලබයි. එහි දී සත්ව ආචාර ධර්මයන් උල්ලංඝනය වනු ලබන අවස්ථාවන් වෙන වෙනම දක්වමින් පුළුල් ලෙස එකී කරුණු විවරණය කර ඇති ආකාරය දැක ගැනීමට හැකි වේ. මෙකී ග්‍රන්ථය තුළ අවධානය යොමු නොකර ඇති පැතිකඩක් වනුයේ සත්ත්ව ආචාර ධර්මයන් කෙරෙහි පවතින බෞද්ධ ආකල්පය පිළිබඳ ව යි. මෙකී අධ්‍යයනය මගින් සත්ත්ව ආචාර ධර්ම සම්බන්ධයෙන් පවතින බෞද්ධ ආකල්පය කෙරෙහි අවධානය යොමු කිරීමට අපේක්ෂිතය. මෙම අධ්‍යනය සිදු කිරිමේ දී මාලනී ආර්යතිලක මහත්මිය විසින් රචිත සත්ත්ව විද්‍යාව නැමැති ග්‍රන්ථයෙන් මෙකී අධ්‍යනයට අදාළ තොරතුරු සමුදායක් ලබා ගන්නා ලදි. එකී කරුණු මත පදනම් වී මාගේ අධ්‍යනයට අදාළ විෂය පථය පුළුල් කර ගන්නා ලදි. එහි අන්තර්ගත නොවන බුදුදහමේ ආකල්පය කොරහිද මෙහිදි අවධානය යොමු කිරිමට අපේක්ෂිතය.

**පර්යේෂණ ක්‍රමවේදය**

සත්ව ආචාර ධර්ම පද්ධතියක් රටකට අවශ්‍යද? යන ගැටලුව මූලික කරගත් මෙම පර්යේෂණය සත්ව ආචාරධර්ම පද්ධතියක් රටකට අවශ්‍ය වේ යන උපකල්පනය මත පිහිටා මෙන් ම බෞද්ධ ඉගැන්වීම්වලට අනුව ද සියලු සත්ත්වයන්ට මෛත්‍රී කළ යුතු ය යන පදනම තුළ සිට ගුණාත්මක පරීක්ෂණ යටතේ එන ග්‍රන්ථ සන්ධාරක්‍රමය මගින් මෙකී අධ්‍යයනය සිදු කරනු ලැබේ. මෙම අධ්‍යයනය සිදුකිරීමේ දී පොත්පත් වලට අමතර ව පුවත්පත් සඟරා ආශ්‍රයෙන් ද දත්ත රැස් කරගන්නා ලදී. එසේ ම අන්තර්ජාලය පාදක කොටගෙන දත්ත රැස් කර ගනු ලැබේ.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

සදාචාර දර්ශනයේ ප්‍රායෝගික ආචාර ධර්ම යටතේ එන ප්‍රධාන තේමාවක් ලෙස සත්ත්ව ආචාර ධර්ම හඳුන්වාදිය හැකි වේ. ආචාර ධර්මයන්හි මූලික අරමුණ වනුයේ අනෙකාගේ පැවැත්ම කෙරෙහි සානුකම්පිත වීම හා කිසිවෙකුට හිංසා නොකිරීමයි. සදාචාර දර්ශනයේ ප්‍රායෝගික ආචාර ධර්ම යටතේ එන ප්‍රධාන තේමාවක් ලෙස සත්ත්ව ආචාර ධර්ම හඳුන්වාදිය හැකි වේ. ආචාර ධර්මයන්හි මූලික අරමුණ වනුයේ අනෙකාගේ පැවැත්ම කෙරෙහි සානුකම්පිත වීම හා කිසිවෙකුට හිංසා නොකිරීමයි.

සබ්බේ තසන්ති දණ්ඩස්ස සබ්බේ භායන්ති මච්චුනෝ

අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයේ (ඛු. නි. 2005).

දඬුවමට සෑම සත්වයෙක් ම බිය වෙති. එසේ ම මරණයට සෑම අයෙක්ම බිය වෙති. ඒ නිසා තමාව උපමාවට ගෙන කිසිම සත්ත්වයෙක් මරන්ටත්, මරවන්ටත් එපා යනුවෙන් බුදුදහමේ උපදෙස් දෙනු ලබයි.

සබ්බේ තසන්ති දණ්ඩස්ස සබ්බේසං ජීවිතං පියං

අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයේ (ඛු. නි. 2005).

සෑම සත්වයෙක්ම දඬුවමට බිය වෙති. සෑම කෙනෙක්ම තමන්ගේ ජිවිතයට ප්‍රිය වෙති. ඒ නිසා තමන්ව උපමාවට ගෙන කිසිදු සතෙක් මැරීමත්, මැරවීමත් නොකළ

යුතු ය. මේ අනුව බෞද්ධ විග්‍රහයට අනුවත් පැහැදිලි වන්නේ සියලුම සතුන්ගේ ජීවිත සුරක්ෂිතතාවයත් ජීවත්වීමේ අයිතියත් තහවුරු කළ යුතු බව යි. එහෙත් ශ්‍රී ලංකාව වැනි රටක මානව හිමිකම් ද අමු අමුවේ කඩ වන විට සත්ව හිමිකම් ගැන බලාපොරොත්තු තබාගත නොහැකි වේ. රිචඩ් ඩී රයිඩර් පවසන ආකාරයට සතුන් තව දුරටත් දේපළ ලෙස, ආහාර ලෙස, ඇඳුම්පැළඳුම් ලෙස, පර්යේෂණ සඳහා, විනෝදාස්වාදය පිණිස, භයානක මෘගයන් ලෙස භාවිතා නොකළ යුතු බව පැහැදිලි කරනු ලබයි. එසේ ම උතුරු ඇමරිකානු නීති විද්‍යාලයේදී සත්ව නීතිය පුළුල් ලෙස උගන්වනු ලබයි. ශ්‍රී ලංකාව තුළ සත්ව අයිතිවාසිකම් පිළිබඳ නීතිරීති පැවතුණ ද අවසානාවට ඒවා යල් පැනගිය ඒවාය. ශ්‍රී ලංකාව තුළ අලි හා සුනඛයින් වනාහි හිංසනයට ලක්වන ප්‍රධානතම සත්ත්ව කොට්ඨාසයි.

මිනිසා යනු සත්ව ලෝකය තුළ ජීවත්වන උසස්ම සත්වයා වන අතර මිනිසා හා අනෙකුත් තිරිසන් සතුන් අතර පවතින සම්බන්ධය ආචාර විද්‍යාව තුළ සාකච්ඡා කරයි. එහි දී මිනිසා අනෙකුත් තිරිසන් සතුන්ගේ පැවැත්ම සම්බන්ධයෙන් සානුකම්පිත විය යුතු ය. මිනිසාට මෙන් ම අනෙකුත් සතුන්ට ද අයිතිවාසිකම් පවතී. ඒ නිසා මිනිසා සතුන් සමග ගනුදෙනු කිරීමේ දී එම සතුන්ගේ අයිතීන් රැකෙන පරිදි සදාචාරාත්මක සීමාව සිට කටයුතු කළ යුතු වේ. සත්ව අයිතිවාසිකම් පිළිබඳ අධ්‍යයනය කරන්නන් අවධාරණය කරන්නේ සතුන්ට අයිතිවාසිකම් පැවතිය යුතු බව මෙන් ම මිනිසා විසින් ඒවා උල්ලංඝනය නොකළ යුතු බව යි. කෙසේ වුවත් මානව ක්‍රියාකාරකම් හේතු කොටගෙන සතුන් බොහෝ විට පීඩාවට පත් වේ. මිනිසා හිතා මතා කරන ක්‍රියාවන් මෙන් ම චේතනාවකින් තොරව කරන ක්‍රියාවන් නිසා සතුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වේ. මේ නිසා සත්වවේදීන් හා පරිසරවේදීන්ගේ මතය වන්නේ තිරිසන් සතුන්ගේ පැවැත්ම කෙරෙහි මිනිසා මීට වඩා සංවේදී විය යුතු බව යි. ඒ නිසා මිනිසා විසින් සතුන්ට සිදුකරන හිංසා ක්‍රියාවන් හඳුනාගෙන ඒවා අවම කර ගැනීමට උපදෙස් අනුබල දීම හා මැදිහත්වීම සදාචාරාත්මක වේදීන්ගේ අනිවාර්ය කාර්යක් වේ.

**ප්‍රතිඵල**

- සත්ව ආචාර ධර්මයන් පිළිබඳ ව මානව ප්‍රජාව දැනුවත් කිරීමට හැකි වීම.
- සතුන් ද ලෝකයේ අයිතිවාසිකම් හිමි පිරිසක් ලෙස තහවුරු කිරීමට හැකි වීම.
- සත්ව හිංසනයට ලක්වන අවස්ථා හඳුනාගෙන ඒවාට විසඳුම් ඉදිරිපත් කිරීමට හැකි වීම.
- සත්ව හිංසනයට අදාල නෛතික පැතිකඩ හඳුනාගැනීමට හැකි වීම.

**නිගමනය**

මේ අනුව පැහැදිලි වන්නේ සත්ත්ව ආචාර ධර්මයන් ද ප්‍රායෝගික ආචාර ධර්ම විෂය පථයේ එන ප්‍රධාන එක් උප විෂය පථයක් වන බව ය. මේ මිහිතලය මත වසන සත්ත්ව ප්‍රජාව ද අයිතිවාසිකම් හිමි පිරිසක් ලෙස තහවුරු කළ යුතු වේ. එසේ ම සත්ත්ව ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දෙන ලද්දේ පුද්ගලයින්ට වන අතර එය පුද්ගලයින් සතුන් සඳහා පිළිපැදිය යුතු යුතුකම් හා වගකීම්වලින් සමන්විත වේ. එනම් මිහිතලයේ

ජීවත්වන අනෙකුත් සතුන්ට ද මිනිසුන්ට සමානව ජීවත්වීමේ අයිතියක් පවතින බව අනාවරණය කිරීම මෙහි මුඛ්‍ය පරමාර්ථය වනු ලබයි. බුදුදහම මගින් සත්ව ආචාර්ය ධර්මයන් කෙරෙහි ද ප්‍රබල ලෙස අවධානය යොමු කරනු ලබයි. මන්ද බුදුදහමේ දක්වනු ලබන්නේ සියලු සත්ත්වයන්ට මෛත්‍රී කළ යුතු බව ය. එසේ ම තමන් උපමාවට ගෙන අනෙක් සතුන් විෂයෙහි ද කටයුතු කර යුතු බව බුදුදහම මගින් අනාවරණය කරනු ලබයි. මේ අනුව සත්ත්ව ආචාර ධර්ම සුරැකීම මගින් මිහිතලයේ ජීවත්වන ජීවීන්ගේ ජීවිත සුරක්ෂිත වනු ඇත.

**මුඛ්‍ය පදඃ** මෛත්‍රීය, සත්ත්ව ආචාර ධර්ම, සත්ත්ව අයිතිවාසිකම්, සුරක්ෂිතභාවය

## ආශ්‍රිත ග්‍රන්ථ

ඛුද්දක නිකාය. (2005). *ධම්මපදය.* බුද්ධ ජයන්ති මුද්‍රණය.

*සංයුත්ත නිකාය.* (2005). මෙත්තානිසංස සුත්‍රය. බුද්ධ ජයන්ති මුද්‍රණය.

ආරියතිලක, මාලනී. බී. (1957). *සත්ව විද්‍යාව.* මහරගමඃ සමන් ප්‍රකාශකයෝ.

මන්තෙයිපෙල්, පී. (2001). සතුන් ගැන කතන්දර. (පරි.) ප්‍රේමචන්ද්‍ර අල්විස්. කොළඹ 10ඃ සූරිය ප්‍රකාශකයෝ.

රත්නාලෝක හිමි, ගලඋඩ. (2019). *දාර්ශනික සංකථන,* මහනුවරඃ බුවනෙක ප්‍රකාශකයෝ.